

# නුඹේ කවියකි.

නිදර්ශණ වාස්

# නුඹත් කවියකි

© ඩබ්ලිව්.ඕ.පී. නිදර්ශණ වාස්

කතa

පළමු දිගහැරීම

වෙස්ලි විද්‍යාලය

12 ශ්‍රේණිය

22.02.2025

ISBN - 978-624-208-266-0

පිටකවරය - කේ.ෂෙරංගි ද ආබaa

චිත්‍ර - ජේ. පසිඳු ශෙනාල්

# පිදුම

කුඩා කල සිට මා දැනුමින් පෝෂණය කළ

මවටත්, පියාටත්,

කාව්‍යකරණයට වඩාත් නැඹුරු කළ

හර්ෂ ගුරුතුමාටත්,

එය ග්‍රන්ථාරූඪ කිරීමට උනන්දු කළ

චන්ද්‍රිකා ගුරුතුමියටත්,

සෙනෙහසින්

මෙම පොත පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යත් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණ ගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


නුවර අහසින්........................................................................1
කිමද?.................................................................................2
ඒ නෙතු විතර ද?..................................................................3
යොවුන් පුතෙකුගේ සිතැඟියක්...............................................4
ශ්වේත රස............................................................................5
කවුරුන්දෝ මේ.....................................................................6
දැනුනු තැන්..........................................................................7
සුන්දර නා මල......................................................................8
කොළඹ සඳ.........................................................................9
කොළඹ සඳ - 2...................................................................10
මඟහැරුණු පෙම් කතා........................................................11
සුරඟන රුව........................................................................12
උතුම් වනිතා.......................................................................13
නොමැකුණු හිස්තැන්...........................................................14
මතුභවේ මගෙ වෙම් ද?.......................................................15
තනිමැකුව ඈ......................................................................16
එක්ස්පයර් වුණ ප්‍රේමයක්!!! .................................................17
ඉරී ගිය පිටු.......................................................................18
නිදොස් තරුවක්..................................................................19
පින්වත් රුව.......................................................................20
සොඳුරිය...........................................................................21
ප්‍රේම නොකරපු හදවතක්.......................................................22
නොසැසඳෙන තරු.................................................................23
මල්වර නැඟණිය.................................................................24
අපේ සුන්දර ගම්මානය..........................................................25
වස්සානයේ පිපුණු කුසුමක්....................................................27
මංගල දින..........................................................................28
කවි සිතක් රැ නිදිවරා.........................................................30


## 01.නුවර අහසින්

නුවරට සීතල සුළඟක් එනකොට
සිහින් පොදට වැහි බිංදු අරන්..
අවසර කියමින් වඩින සැඳෑදුර
දුටිමි හිරුත් බැස යන අහසින්..

සඳේ ලකුණු නැත, නුඹත් එසේම ය
හිස් වී වැව ළඟ අසුන ඉතින්..
ගලා ඇදෙන දිවි නුවර අහස යට
කඳු පල්ලම් නිම නොවන ලෙසින්..

කවියට, ප්‍රේමෙට, දහමට මුල් වූ
සෙංකඩගල නුවරම මනරම්..
නුවර විතර ම ද කොළඹත් එහෙමයි
නුඹත් කොළඹ අද හිටියා නම්..

ශ්වේත තඹර පෙති, සිහිල් දියේ වැද
දුටුවන්ගේ නෙත් සිත් පිනවන්..
එහෙව් මලක් වුව පර වූ පසුවක
අහක දමන පින්වත් ජනයන්..



## 02.කිමද?

රිවිත් සමඟ ම මියෙන්නට නම්
කිමද උදයේ කුසුම් පිපුණේ
සඳුත් සමඟ ම වෙන්වන්ට නම්
කිමද දහසක් තරුත් තිබුණේ
පරවෙනා විට දුගඳ වේ නම්
කිමද මලකට සුවඳ ලැබුණේ
සෑම අවසන කඳුල වේ නම්
කිමද ඇරඹුම සිනහ නැගුණේ



## 03.ඒ නෙතු විතර ද?

දහසක් විවිධ වූ කුසුම් තිබෙන ලොව
පෙම්බර වූයේ රෝස විතර ම ද?
දහසක් විහඟුන් ගී ගයනා ලොව
මිහිරි ම ගීයන් කොවුලගෙ විතර ද?
දහසක් දියඇලි ඇදහැලෙනා ලොව
සුන්දර වූයේ දුන්හිඳ විතර ද?
දහසක් නෙත් යුග සැරිසරනා ලොව
සැබෑම සුන්දර ඒ නෙතු විතර ද?



## 04.යොවුන් පුතෙකුගේ සිතැඟියක්...

ඔය අතින් බත් ටික කවනකොට
දැණුන උණුහුම පෙරලෙසම මට
හැකි නැතත් උකුලේ නිදන්නට
හිස තබන්නම් ඇහැකි ලෙස මට

කියූ නැළවිලි ගීත තාලෙට
කුඩා කල මා සැනසවූ හඬ
තවම මාගේ සිතේ හැමතැන
එයයි අම්මේ මිහිරි ගීතය

කියූ රසබර කතා ඔබගේ
පෙවූ ලේ කිරි මිනුම් නැත්තේ
තුති කියන්නේ කෙලෙසදැයි මම
ඔබ ඉගැන්වූ අකුරු මදිනේ

සිතෙයි හැමවිට වැළඳගන්නට
පිරුණු පෙම ඔබහට කියන්නට
එබැව් සිතනා සැමවිටකම
වැටෙන කඳුලයි ඉන්නෙ හරහට

ඔබයි සැමදා උතුම් මනුකත
මා තනන මන්දිරයෙ රැජිණිය
කුඩා කවකට කිසිදාක බැහැ
ඔබේ ස්නේහය ගැන කියන්නට




## 05.ශ්වේත රස

ඉඩෝ්රය මැද දරා සිටිනා
පතොකෙ එල්ලුනු එක් මලක්..

විඩාබර නෙතු පියා සැනසෙන
කටු පිරුණු එක් තුරුහිසක්..

නුරා ඉඳුදුනු වර්ණ අතරේ
ශ්වේත රස දුටු කවි හිතක්..

වසන්තෙට පමණක් පිපෙන මල්
එපා දිවියට කොහොමවත්..



## 06.කවුරුන්දෝ මේ

හිනාව නෙත් වසඟ කරන
නුරාව පිරි රෝස දෙතොල
එක් වී සිත මත් කරවන
කවුරුන්දෝ මේ...

දෙව්ලියක් ද නර වෙස් ගත්
සිහිනයක් ද රෑ මැදියම්
සොඳුරු රුවේ නම නොදනිම්
කවුරුන්දෝ මේ...

රෝස කොපුල් නෙත් නිල්වන්
සිහින මවන රෑ මනරම්
උපමා නෑ ඒ රුපෙට
කවුරුන්දෝ මේ...

පෙරදිනයේ හමුවූවත්
අද මා සිත උරුමකරන්
ලොවට හොරා මා සිත් ගත්
කවුරුන්දෝ මේ...



# 07.දැනුනු තැන්

කොලොම්පුරයෙන් ගමන් අරඹා
ගෝකණ්ණයේ නැවතිලා
සබරගමුවේ දිලෙන හද තුළ
කොළඹ හදවත් ගුලිවෙලා
අසීමිත වූ අහම්බෙන් වූ
ගී කවක මුල් තනු ලියා
දෙතැන හදවත් දෙපසකින් දැන්
එක ම කවියක නැවතිලා

පිටත සම්මත නීති මැද්දෙන්
හැඟුම් බිඳු බිඳු ඉහිරිලා
වචනවලටත් කලියෙන් ම රෑ
නෙත් කොනින් ප්‍රේමය ගලා
අඳුරු අහසේ සිනිඳු අත්ලේ
ලවන් හොරැහෙන් දැවටිලා
නුඹට දැනුනි ද දැනුනු තැන්වල
අපේ හදවත් නැවතිලා

## 08.සුන්දර මල

සුන්දර සුවඳ වූ මල අතු අග පිපුණා
අඳුර වැටෙතත් ම ඒ මල හැකිල වුණා
එනමුදු එවැනි මල් තව පසු දින පිපුණා
එනමුත් එයින් කිසිවක් පෙර මල නොවුණා

පෙර මල රුවට සම රුව ඇති මල් තිබුණා
පෙර වූ සුවඳ පැරදූ තව මල් තිබුණා
පෙර මල තැන ම වෙනත් මලක් ගෙන තිබුණා
එනමුත් එකී කිසිවක් පෙර මල නොවුණා



## 09.කොළඹ සඳ

කොළඹ අහසේ තිබුණු සඳ අද
ගාලු අහසේ පායලා
ගාලු පුරය ම එළිය වූවත්
කොළඹ අඳුරේ තනි වෙලා
දහසකුත් තරු පායා තිබුණත්
සඳේ නුඹ එහි අඩු නිසා
පෙර ලෙසින් අහසට වඩිනු මැන
දෙනෙත් රෑ නොනිදන නිසා

ගාලු පුර සුන්දර වුවත් නුඹ
හට කොළොම්පුරයට වඩා
නුඹව නම් සුන්දරම වැඩිපුර
කොළොඹ අහසට මැදි වෙලා
කොළඹ මද්දහනෙදිත් විහඟුන්
නුඹ ගැන ම ගයනා නිසා
දෙනෙත් තෙත් වෙයි අඳුර රජවෙයි
අහස් තලය ම ගොළු වෙලා



## 10.කොළඹ සඳ -2

අඳුර මකනා සඳක් විය නුඹ
අහසෙ සඳරැස් විහිදුවා
මල් පුබුදිනා රැයක් විය නුඹ
දකින විට මල් හිනැහෙනා
කොළඹ අහස ම හැඩ කළේ සඳ
නුඹයි පෙරදා පායලා
ඉතිං සඳ මගෙ සඳ ම විය නුඹ
සයුර අද්දර හිනැහෙනා

කුමන අහසක පැයුවත් නැත
සඳේ මගෙ පෙම අඩු වෙලා
දවල් රෑ ද්විත්වයෙහි මගෙ නුබ
නුඹ හට ම දැන් හිමි වෙලා
කොළඹ සිට මේ ලියන කවියේ
රස බලා පිළිතුරු ලෙසා
නුඹත් කවියක් ලියනු මැන සඳ
ගාලු අහසේ තතු කියා

## 11.මඟහැරුණු පෙම් කතා

මඟහැරෙන බව දැන දැන ම
අතිනතින් ඇල්ලූ ප්‍රේමයේ...
නොසිඳවෙන පෙම් ගී පිපාසෙක
අතරමං වූ සිහිනයේ...
සියුම් මල් පෙති තලා විසිකර
වළ දමා හිත් ගංතෙරේ...
පෙම් කතා ඈත ලොවට රහසින්
සැඟව අදටත් මිහිකතේ...

## 12.සුරඟන රුව

ළමැද සොඳුරුය - ලෙළෙන විට බඳ
රෝස පැහැතිය - කොපුල් සිනිඳුය
පාද සොලවන - මියුරු තාලය
මවයි රාගී - නෙතක ආලය

ශෘංගාර වූ - රූප සොබහව
අනුරාග වූ - දෙනෙත් මිණිකැට
සුපෙම්බර වූ - සිනහ කැන් පොද
සිතට ඇරයුම් - එවයි පෙම්බර

නීල වරලස - ගොතා රිසි ලෙස
සිනිඳු ළාමක - අත්ල රස දෙන
එක්ව නල හා - හැඟුම මිහිරිය
ආල උපදන - රුවකි සුරඟන



## 13.උතුම් වනිතා

වරින් වරම ලෝහිත බිඳු ගතින් හැලෙන රිදවා
නුඹත් සැමරුව ද හිතවති එය ඇරඹූ හින්දා
ඒ දුක් පිරිමින්ගෙ හිතට නොදැනුනි ඒ ලෙසටා
එනිසා ගැහැණිය මෙතරම් තලා පෙලා බිඳලා

මුහුණේ නැත වේදනාව, ඒ මනරම් සිරියා
රැවුලේ මොන ගතිද සොයුර, අපට කොයිද සවියා
දිනකට දැනුනොත් මේ දුක පිරිමි ගතක් රිදවා
වස පැණි පිරවූ බෝතල් ඇතිද එකක් දිනටා

නුඹෙ මවටත්, දුවටත් ඒ දුක දැනුනේ එලෙසා
එපා පහත් කරනට මේ උතුම් විරිය වනිතා
පුදා සුදුසු ගෞරව සැම කතට අවැසි විටෙකා
විරිත් කුමට මේ කවියට, සිතනු අදින් පසුවා

## 14.නොමැකුණු හිස්තැන්

පපුව මැද්දේ සියුම් තැන් ගෙන
හිමි හිමින් කිතිකවකවා...
නුපුරුදුම පෙම් හැඟුම් හොරැහෙන්
හදේ පතුලට ගිල්වවා...
නොහැඟි පෙම් හැඟුමන් ගලායන
සිහිනයක් මා සිත මවා...
මටත් නොකියම නුඹ ගියා මා
සිහින මැද තනිකරදමා...

වචන ටික ටික මැකී යද්දී
හැඟුම් එතනම නැවතිලා...
එදා නුඹගෙන් දැනුනු සුවඳම
අදත් හසුනෙනේ දැනෙනවා...
සදාකාලික මිතුදමක් ඇයි
එක ම මසකින් නැවතිලා...
තවම හිස්තැන් මැකී නැත නුඹ
ගියත් මේ හිත පාරලා...



## 15.මතුභවේ මගෙ වෙම් ද?

වෙන හදක උණුහුමක ඔය හිතත් නැවතිලා
මේ භවය පුරාවට නුඹ ඔහුට හිමිවෙලා
නුඹ අයිති කරගන්න මෙභව බැරි වූ නිසා
දුරින් හිඳ බලා ඉමි පෙම් සිතින් සැරසිලා

ළැම රස්නෙ විඳගන්න බැරිවුවෙන් දිවිපුරා
නුඹෙ පපුවෙ සැනසුනෙම් සිහිනෙකින් ළංවෙලා
සම්මතව පෙම්කරන අරමුණින් හඬනඟා
මතුභවේ මගෙ වෙම් ද නුඹ පෙමින් හැඩවෙලා

## 16.තනිමැකුව ඇ

එදා මගෙ රෑ තනිමැකුව ඇ
අද කොහේදැයි මමත් නොදනී...
එදා සැනසුම මෙදා විඳවුම
වූ අයුරු මනසේ රැඳේවී...
පෙමින් පෙරදින ලියූ පදවැල්
පරදනා දුක් ගී ලියේවී...
මෙයත් අහසට විසිකරන්නම්
සඳ තරුත් දුක් වී හඬාවී...



## 17.එක්ස්පයර් වුණ ප්‍රේමයක්!!!

එක්දිනක් දැකලා, නෙත් යුගක් පිරුණු
තප්පරෙක ඇහිපිහෙන්
හීන දාහක් මැවුණු
සබඳ,
මටත් තිබුණා...
ඩිස්නි ලෝකේ ප්‍රේමයක්!

ප්‍රේම බස් කොඳුරලා, සඳ මෝදු වන තුරු
ඇමතුමට හාදු දී
ගව්ගණන් ගියපු
සබඳ,
මටත් තිබුණා...
නිමක් නොදුටුව ඇමතුමක්!

කාලෙකට කලින් නම්, එය එසේ වූ නමුත්
ගෙවී ගොස් හැඟුම් අද
හේතු නැතිවයිලු
සබඳ,
ඒක නම් දැන්...
**එක්ස්පයර් වුණ ප්‍රේමයක්!!!**

## 18.ඉරී ගිය පිටු

ඉරී ගිය පිටු තවත් කුමටද
මතක අමතක කර එදා
අලුත් පිටුවක කවි ලියන්නෙමි
සිහින යළි දළු ලා මෙදා...

බොඳව ගිය පද මකා දැමුවෙමි
කොතෙක් රස දුන්නත් එදා
බිඳුනු පද වැල් යළි ගොතන්නෙමි
සුන්දරව පෙරටත් වඩා...

නැවුම් පිටුවල සුවඳ වින්දෙමි
සැතපෙමින් මුළු රෑ පුරා
කවි අතර සිට සිහින දුටුවෙමි
නොදුටු හෙට ගැන සිත සිතා...

## 19.නිදොස් තරුවක්

සදොස් අහසක නිදොස් තරුවක්
සඳේ එළියට ළංවෙලා..
සිතා ගන්නට නොහැකි ලෙස අද
අමාවක බිය සිත වෙළා..
උහුලන්ට බැරි රිදුම් හිතැතිව
නෙතු කොනින් කදුලක් ගලා..
අමාවකටත් වඩා බියකරු
පුර අවක හද තනිවෙලා..

නොසිත කියැවුණු හී පහරකින්
සිතේ රිදුමක් පැරිලා..
පෙමින් පුරවා මම ලියූ කවි
ලොවට අද වස් කවි වෙලා..
රිදුනු හැඟුමන් දහසකුත් මැද
පිටත හදවත ගොළුවෙලා..
යළිත් කවි නොලියනා ලෙසටම
වචන කවියට හිඟවෙලා..

## 20.පින්වත් රුව

මල් පෙති සුළං රැල්ලේ නැළවෙන අයුරින්
විහඟෙකු ගුවනෙ තාලෙට පියඹන අයුරින්
නිල්වන් දිය පිරුණු ගඟ ගලනා අයුරින්
පින්වත් රුවක් පැමිණෙයි නිසසල ගමනින්

හිසකේ නොමැත - වහන් නොමැත පා යුගට
සිල්වත් මුහුණ සිත සනසන දකින විට
සංවර බැල්ම රාග කෙලෙස් බාල කොට
මිනිසෙකි මොහුත් හික්මුණු, සිත දියුණු කොට

සංවර බසින් සැමදෙනටම අමතමින
කසාවතක් සිරුරේ පොරවා සිටින
තිලොවග මග වඩින, ඒ හිමි ගුණ ගයන
ලොව්තුරු සැපත සොයමින් යන මේ ගමන



# 21.සොඳුරිය

වැටෙන දිය බිඳු

අතර දිලිසුණු

දේදුන්න

නුඹ වීය සොඳුරිය...

හමන සීතල

සුළඟෙ මුසු වූ

පෙම් සුවඳ

නුඹ වීය සොඳුරිය...

එලෙස පෙරදින

සුවඳ දේදුනු

තැනුව නුඹ

අද කොතැන සොඳුරිය...

මතක හී සර

එවා නිතොරම

තෙත් කළේ නෙතු

කෙලෙස සොඳුරිය...



## 22.ප්‍රේම නොකරපු හදවතක්

නිල්පාට යැයි කවියො කීවට

දුටුවා ද නිල් දියවරක්...

සතුටු කඳුළක වුවත් ඇතුළත

තිබෙන්නට හැක දුක් කවක්...

නිල්පාට මේ අහස යට ඇත

වෙනස් නොවනා එක් දෙයක්...

හිමිව තිබුණත්, නොතිබුණත් නැත

ප්‍රේම නොකරපු හදවතක්...





## 23.නොසැසඳෙන තරු

සඳේ නුඹටත් මම කියන්නම්
තනිකඩව උන් හිතේ සාමය
නුඹත් කිසිදා අඳුරු රැයකදි
එපා තරු හා හාදුවන්නට

නොදැනීම බොහො දුරක ගිය විට
කෙලෙසකින් සිත හදාගන්න ද
නුඹේ පෙම ගැන හැඟීමක් නැති
සිතක් ගැන ළතැවුලක් කුමටද

නිදහසේ සුවයහනෙ ඒ ගත
සැතපෙද්දි මුළු රැයක් සිහිනෙක
කුමට නුඹ ඒ තැවුල් සිහිනෙක
නොකා දුක් වී රැයක් නිදිවර

ඒ නිසා යළි යළිත් කියමි ය
නොසැසඳෙන තරු සමග සිහිනෙක
එපා හාදව බස් දෙඩන්නට
නිසැකවම දුක උරුමවනු ඇත....

## 24.මල්වර නැගණිය

සුබ ම මොහොතින් පාද තබමින්
යොවුන් දිවියට මේ දිනේ...
හිසගෙ නැහැ වූ නැවුම් සිලිලෙන්
සුපිරිසිදු සුවඳත් වුණේ...
ස්වේත පැහැ සළු වත දරාවිත්
කසුන් කනකර පළඳිනේ...
සොඳුරු හෙටකට නගේ මාගෙන්
අසිරි අනුහස් පතන්නේ...

දිලුනු නෙත් වඩ වඩා දිලිහී
තවත් ප්‍රේමෙන් පිරේවී...
කැකුළු බැබළෙන සිනහ වැඩි වී
මුවඟ සඳවත පෙනේවී...
සිරුර පැහැ වී තවත් හැඩ වී
සුරඹකගෙ සිරි ගලාවී...
සවිය වන්නට නුඹට ප්‍රේමෙන්
මමත් පසුපස රැඳේවී...

## 25.අපේ සුන්දර ගම්මානය

සන වනරොදට මැදි වූ ගම　　සුන්දරය
එහි එක් දෙසින් පිහිටියෙ මහ　　කඳුවැටිය
කෙත් යායට නුදුරින් වූ මහ　　ඇළ ය
මේ සැම සපිරි අපගේ ගම　　සුන්දරය

කඳු අතරින් රිවි නැගෙනා　　හිමිදිරිය
සියොපත් රැහැන් හඬ නගනා　　හිමිදිරිය
සුපිපි මලින් සුගන්ධ වූ　　හිමිදිරිය
මේ සැම සපිරි අපගේ ගම　　සුන්දරය

ඇළ දෙපස ම තිබුණේ මල්　　කෙකටිය ය
පිළිහුඩු හාමි තපස් රැක්කෙ　　අසලක ය
හුංගො පැන්නො වැනි මීන් රළ　　එතැනම ය
මේ සැම සපිරි අපගේ ගම　　සුන්දරය



මද්දහනේ ගම දරු කැල වන මැද ය
නටමින් ගී ගයමින් කෙළි කරමින් ය
කුසුම් වෙතට ඇදගන්නා බිඟුවැල් ය
මේ සැම සපිරි අපගේ ගම සුන්දරය

මඩ පිරි විලේ පිපුණේ සියපත් එක ය
රැය කළුවරේ බබළන පුන්සඳ වැනි ය
ඉගිල ගියේ සමනළ රොන් ඒ වට ය
මේ සැම සපිරි අපගේ ගම සුන්දරය

දිනකර බැසී නැග එන්නේ තරුපති ය
ශ්වේත වර්ණ කුසුම්ද කැඳවාගෙන ය
බියකරු රැයෙත් ගම්මානය පියකරු ය
මේ සැම සපිරි අපගේ ගම සුන්දරය

## 26.වස්සානයේ පිපුණු කුසුමක්

කටුක අම්හිරි කාලයක නැගි

මතක ගොන්නක් පිරිවරා...

වසන්තය පැමිණෙනා දින තෙක්

බලා සිටි නෙත් නිදිවරා...

එකල සුන්දර මල් සුවඳ විඳ

තුටින් පිරි සිත හැරදමා...

වස්සානයේ පිපුණු කුසුමත්

කිම ද අවසන පරවෙලා...

## 27.මංගල දින

එදා ගිය ඒ අතේ එල්ලී
වෙනකෙකුන් සමඟින් තුරුල් වී
මවගෙ දෙනෙතින් කඳුළු වැටුණා
මතකයි ද නැගනී...

පිය නෙතත් තෙත් වී විඩා වී
පිස දැමූ කඳුලේ දුකක් වී
සඟවන්න බැරි වුණා සිපගත්
මොහොතෙ ඔබ පැමිණී...

සියලු දෙන මව්පියට ළං වී
දුක නිවා පිසදා දමද්දී
නුඹට නොදැනිම පසෙක ඉදගත්
මටත් ඉකිගැසුනි...

සහෝදර ප්‍රේමයත් මනරම්
නොදුටු නෙතකට වුණේ සරදම්
නුඹ රකින්නට වෙහෙස වුණු සැටි
නොදත් නුඹ රන්වන්...

යළිත් රක්නට නුඹේ රන් රුව
අවැසි නොව බව මගේ වීරිය
දැනී නිහඬව බලා සිටියෙමි
තුටු නුඹේ නිල් නෙත්...

කඳුළු සඟවා තුටින් සපිරිව
සෙත් පතා පෙම් පිරුණු සිතැතිව
යළිත් ගොස් රෑ යහන මත දී
පාළු දුක වින්දෙමි...

## 28.කවි සිතක් රෑ නිදිවරා

ලියාගන්නට බැරිම තැන අද
හිතේ හැඟුමන් ගොළුවෙලා...
පැන් තුඩු අග රැඳුණු නිල් බිඳු
තෙතක් නැතිවම වියළිලා...
මලානික නෙත, නුරා කවියක
පෙමින් තව තව පැරිලා...
ආදරේ නම් රිදුම් සිහිනෙම
කවි සිතක් රෑ නිදිවරා...

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව (2014) වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකි ය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන් ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාත්‍ය සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

නුඹත් කවියෙකි.